සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

**6 ශ්‍රේණිය** **කතෝලික ධර්මය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

### I කොටස

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. කිතුනු ජීවිතයේ විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ,

(1) පංච පුස්තකය (2) ශු. බයිබලය
(3) සුභාරංචි ග්‍රන්ථය (4) නික්මයාම පොත

02. ශු. බයිබලයේ නව ගිවිසුමේ ඇතුළත් ග්‍රන්ථ ගණන වන්නේ,

(1) 73 (2) 46
(3) 72 (4) 27

03. ශු. මතෙව්තුමාගේ සුබාරංචියේ සංකේතය වන්නේ,

(1) සිංහයා (2) රාජාලියා
(3) මිනිසා (4) ගවයා

04. හයවන දවසේදී දෙවියන් වහන්සේ මනුෂ්‍යයා මැවීමෙන් පසු පවසන වචනය වන්නේ,

(1) එය සුන්දර බවය. (2) එය ඉතා මනහර බවය.
(3) එය කදිම බවය. (4) එය අපූරු බවය.

05. කිතු උපත සමයේ රෝමය පාලනය කළ අධිරාජ්‍යා වන්නේ,

(1) අගෝස්තුස් අධිරාජ්‍යා (2) හෙරෝද් අධිරාජ්‍යා
(3) දාවිත් රජතුමා (4) පිලාත් අධිරාජ්‍යා

06. ආරම්භක දේව ප්‍රසාද නිධාන පමණක් අඩංගු වරණය වන්නේ,

(1) පූජකවරය හා අභිවෘද්ධි ආලේපය.
(2) ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය.
(3) දිව්‍ය සත්ප්‍රසාදය හා පාපොච්චාරණය.
(4) ප්‍රසාද ස්නාපනය හා පූජකවරය.

07. සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කරන ලද්දේ,

(1) පාස්කු ඉරුදින (2) නත්තල් දින
(3) මහ බ්‍රහස්පතින්දා දින (4) ආලේලූයියා සෙනසුරාදා දින

08. කිතුනුවන්වන අපට "ආත්ම දමනය" පුහුණු කරනු ලබන්නේ,

(1) ගොඩමස් වැළකීමෙන් (2) එක්වරු ශීලය රැකීමෙන්

(3) පාපොච්චාරණය මගින් (4) ආධාර ලබාදීම මගින්

09. ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබඳව සිහි කරනු ලබන යාච්ඤාවකි.

(1) දයාධික මනස්තාපය (2) පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව

(3) තුන්කාල ආරාධනාව (4) විශ්වාස ලක්ෂණය

10. අති පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය සමරනුයේ,

(1) දෙසැම්බර් 25 ය. (2) දෙසැම්බර් 08 ය.

(3) අගෝස්තු 15 ය. (4) ජනවාරි 01 ය.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

11. නව ගිවිසුමේ පළමු ග්‍රන්ථ හතර ........................................................................................ ලෙස හඳුන්වයි.

12. ........................................................................................ දිවැසිවරයා කිතු උපත පිළිබඳව සඳහන් කරයි.

13. එක් වරක් පමණක් ලබාගත හැකි දේව ප්‍රසාද නිධාන ........................................................................ කි.

14. ........................................................................................ එක්වරු ශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථයකි.

15. නමෝමරිය යාච්ඤාව ප්‍රධාන කොටස් ........................................................................ කින් සමන්විත වේ.

( යෙසායා, සුබාරංචි, තුන, දන්දීම, දෙක )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. සුවදානයේ දේව ප්‍රසාද නිධාන තුනකි. ( )

17. මෝසස්තුමා දස පණත ලබා ගැනීමට පෙර දින 40 ක් යාච්ඤා කළේය. ( )

18. මහ සිකුරාදා දින එක්වරු ශීලය රැකීමට නියමවන දිනයකි. ( )

19. ජේසුස් වහන්සේ විසින් ම ඉගැන්වූ යාච්ඤාව ස්වාමිවාක් ආරාධනාව වේ. ( )

20. දයාධික මනස්තාපය මගින් ජේසුස් වහන්සේගේ උත්ථානය පිළිබව සිහි කරනු ලබයි. ( )

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) පංච පුස්තකයට අයත්වන පොත් දෙකක් ලියන්න.

(ii) දෙවියන් වහන්සේ හයවන දිනයේදී මවන ලද මැවිලි දෙක ලියන්න.

(iii) මහ බ්‍රහස්පතින්දා දින ස්ථාපිත කරන ලද දේව ප්‍රසාද නිධාන දෙක ලියන්න.

(iv) ප්‍රසාද ස්නාපනයේදී භාවිත කරන සංකේත දෙකක් නම් කරන්න.

(v) දෙවියන් වහන්සේට නමස්කාර කිරීමට අපට උගන්වන පනත් දෙකක් ලියන්න.

(vi) ජේසුස් වහන්සේ සතුරන්ට ප්‍රේම කළ ආකාරය ආදර්ශයට ගනිමින් සතුරන්ට ප්‍රේමය දැක්වූ ශු. සභාවේ චරිත දෙකක් නම් කරන්න.

(vii) යාච්ඤා කිරීම පිළිබඳව අපට උගන්වන උපමා දෙකක් නම් කරන්න.

(viii) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා දෙකක් නම් කරන්න.

(ix) මරියතුමිය දර්ශනය වූ අවස්ථා දෙකක් නම් කරන්න.

(x) දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමේදී භාවිත වන ක්‍රම දෙක ලියන්න. (ල. 2x10=20)

02. (i) නිතර භාවිත වන පොදු යැදුම් දෙකක් ලියන්න. (ල. 02)

(ii) පොදු යැදුම්වල ප්‍රයෝජන තුනක් නම් කරන්න. (ල. 03)

(iii) දේව දරුවන් ලෙස සමාජයේ යහපත් ලෙස ජීවත්වීමට අවශ්‍ය වරම් පතා යැදුමක් නිර්මාණය කරන්න. (ල. 05)

03. (i) එක්වරු ශීලය රැකිය යුතු දවස් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ශු. සභාවේ ශික්ෂා පද තුනක් නම් කරන්න. (ල. 03)

(iii) ශු. සභාවේ ශික්ෂා පද අනුගමනය කරමින් ජීවත්වීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ල. 05)

04. (i) සහෝදර ප්‍රේමයෙන් දිවි ගෙවීමට අපට උගන්වන පනත් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) හතරවන පනතින් අපට ලැබෙන මඟපෙන්වීම් තුනක් ලියන්න. (ල. 03)

(iii) ප්‍රේමයේ සමාජයක් ගොඩනැගීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ල. 05)

05. (i) පාස්කු අභිරහස යනු කුමක්ද? (ල. 02)

(ii) සබත් දිනදී අප විසින් නොකළ යුතු කාර්යයන් තුනක් ලියන්න. (ල. 03)

(iii) දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගී වීමට ඔබට හැකි දේවල් පහක් නම් කරන්න. (ල. 05)

06. (i) සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න. (ල. 02)

(ii) රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා තුනක් නම් කරන්න. (ල. 03)

(iii) රෝගීන්ගේ ආලේපය දේව ප්‍රසාද නිධානය තුළින් ලැබෙන වරප්‍රසාද පහක් නම් කරන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 2 ) 02. ( 4 ) 03. ( 3 ) 04. ( 2 ) 05. ( 1 ) 06. ( 2 ) 07. ( 1 ) 08. ( 2 ) 09. ( 2 ) 10. ( 4 )

11. සුබාරංචි 12. යෙසායා 13. තුන 14. දන්දීම 15. දෙක

16. (X) 17. (✓) 18. (✓) 19. (✓) 20. (X)

## II කොටස

01. (i) උප්පත්ති, නික්මයාම, ගණන් කථාව, ලෙවී ව්‍යවස්ථාව, ද්විතීය නීති සංග්‍රහය.

(ii) මිනිසා, සතුන්

(iii) දිව්‍ය සත්ප්‍රසාදය, පූජකවරය.

(iv) ජලය, සුදුවස්ත්‍රය, පාස්කු ඉටි පහන, ශු. තෛලය

(v)
- සැබෑ වූ එකම දෙවියන් වහන්සේට වන්දනා කරව.
- දෙවියන්ගේ ශ්‍රී නාමය ගැන බොරුවටවත් නිරන්තරයටත් නොදිරව.
- ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් නිවාඩු වලංගු කරව.

(vi) 1. ශු. ස්තේපන් තුමා. 2. ශු. දෙවන ජුවාම් පාවුළු මුනිතුමා

(vii) 1. පරිසිවරයා හා අයකැමියා පිළිබඳව උපමාව.
2. මැදියම් රැයේ පැමිණි මිත්‍රයා පිළිබඳ උපමාව.
3. අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා පිළිබඳ උපමාව. (පිටු අංක 93)

(viii) 1. බෞතිස්මය ලැබීමේදී. 2. සුවය දානය කිරීමට පෙර 3. අන්‍ය රූප විලාශවීමට පෙර
4. පේදුරු තුමාගේ මහා ප්‍රකාශයට පෙර 5. කුරුස ගසේදී (පිටු අංක 96)

(ix) පාතිමා නුවර දර්ශනය වීම. ලූර්දු නුවර දර්ශනය වීම.

(x) 1. කට පාඩම් කරගත් යාච්ඤා භාවිත කිරීම. 2. තමන් විසින් නිර්මාණය කරගත් යාච්ඤා භාවිත කිරීම.

(ල. 2x10=20)

02. (i) උදය ආරාධනාව / ස්ප්‍රීන්තු සාන්තු යාච්ඤාව / භෝජන ආශිර්වාදය / රැකවල් දේවදූතයාට යාච්ඤාව.
(පිටු අංක 98/99/100) (ල. 02)

(ii)
- යාච්ඤා කිරීමට හුරුවක් ලැබීම.
- යාච්ඤා නිර්මාණයට මඟ පෙන්වීමක් ලැබීම.
- පෞද්ගලික යාච්ඤාවේදී පවා භාවිත කළ හැකි වීම.
- පොදුවේ යාච්ඤා කරන විට ශබ්ද නඟා සියලු දෙනාටම උච්චාරණය කළ හැකි වීම. (ල. 03)

(iii) සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 05)

03. (i) අළු බදාදා / මහ සිකුරාදා / අවුරුද්දේ සෑම සිකුරාදාකම (ල. 02)

(ii)
- ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් මුළු පූජා යාගයට සහභාගී වීම.
- වසරකට වරක්වත් පාපොච්චාරණය කිරීම.
- පාස්කු සමය තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම.
- නියම වූ දිනයන්හි ගොඩමස් වැළකීම හා එක්වරු ශීලය රැකීම.
- සභාවේ නඩත්තුවට ආධාර කිරීම. (ල. 03)

(iii)
- දිව්‍ය පූජාවට සහභාගී වීම.
- හැකි සෑම විටම පාපොච්චාරණය කිරීම.
- මීසම තුළ පවත්නා දයා කටයුතු සඳහා පරිත්‍යාගශීලී වීම.
- සෑම දිව්‍ය යාගයකදී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම.
- හැකි සෑම දිනයකම එක්වරු ශීලය රැකීම.... ආදී පිළිතුරු (ල. 05)

04. (i)
- මව්පියන්ට සංග්‍රහ කරන්න.
- ජීවිතය විනාශ නොකරන්න.
- කාම මිථ්‍යාචාරය නොකරන්න.
- සොරකම් නොකරන්න.
- බොරු සාක්ෂි නොකියන්න.
- පරදාර ආලය නොකරන්න.
- අන් වස්තු ආශා නොකරන්න. (ල. 02)

(ii)
- දෙමාපියන් වැඩිහිටියන් හා ශ්‍රේෂ්ඨයන්ට ගරු කිරීම.
- දෙමාපියන්ගේ හා වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිපැදීම.

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

- තම යාච්ඤාවලදී දෙමාපියන් හා වැඩිහිටියන් වෙනුවෙන් යාච්ඤා කිරීම.
- ඔවුන්ට ආදරයෙන් හා කරුණාවෙන් සැලකීම. (ල. 03)

(iii)
- සියල්ලන්ටම සමානාත්මතාවයෙන් සැලකීම.
- සියලු දෙනාටම ගරු කිරීම.
- අන් අයගේ ජීවිත උසස් කොට සැලකීම.
- අන්මත ඉවසීම.
- දස පණතට අනුව ජීවත් වීම..... ආදී පිළිතුරු (ල. 05)

05. (i) ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානයයි. (ල. 02)

(ii)
- දිව්‍ය පූජාව අතපසු කිරීම.
- ඉරුදින දිව්‍ය පූජාවට හා දහම් පාසලට සහභාගී නොවී උපකාරක පන්තිවලට හෝ විනෝද ගමන් බිමන් යාම.
- ඉරුදින අනවශ්‍ය ලෙස මුදල් ඉපයීමේ කාර්යයන්හි නිරත වීම.
- දේවස්ථානය තුළ කතා කිරීම, විහිළු තහළු කිරීම හා ජංගම දුරකථන භාවිත කිරීම ආදී ක්‍රියා.
- අසංවර ඇඳුම් විලාසිතාවන්ගෙන් දිව්‍ය පූජාවට සහභාගී වීම..... ආදී පිළිතුරු (ල. 03)

(iii)
- ආරම්භයේ සිට අවසානය දක්වා මුළු දිව්‍ය පූජාවට සහභාගී වීම.
- ගීතිකා ගායනා කිරීම.
- භක්තියෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම.
- විනීතව හැසිරීම.
- යාච්ඤා වලට පිළිතුරු ලබා දීම.... ආදී පිළිතුරු (පිටු අංක 87) (ල. 05)

06. (i)
- රෝගීන්ගේ ආලේපය
- සමගි සන්ධානය. (ල. 02)

(ii)
- කෙනෙකු බරපතල ලෙස ශාරීරික රෝගීව සිටින විට.
- බරපතල ශල්‍යකර්මයකට පෙර.
- වයස්ගතව රෝගීව සිටින විට.
- මරණාසන්න මොහොතක.
- බරපතල අනතුරකට පසුව. (ල. 03)

(iii)
- ක්‍රිස්තුන් වහනසේගේ දුක් ප්‍රාප්තියේ කොටස් කරුවෙකු වීම.
- වේදනාව දරා ගැනීමේ ශක්තිය.
- පව් කමාව.
- ශාරීරික සුවය.
- සදාතන ජීවිතය ලබා ගැනීමට සූදානම් වීම. (ල. 05)